# කාන්තාවන් බලසතු කිරීම ශක්තිමත් කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා ව්‍යවස්ථාවක් සැලසුම් කිරීම

WE EFFECT

LAW & SOCIETY TRUST

මෙම ලියවිල්ල බිනේන්ද්‍රි පෙරේරා විසින් නීතිය හා සමාජභාරය සඳහා ලියන ලද වාර්තාවකින් සකස් කරන ලදී

## ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා ව්‍යවස්ථාවක් තුළ...

- කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස ඇතුළත් වේ
- කාන්තාවන්ගේ අභිලාෂයන් සහ සහභාගීත්වය පිළිබඳව සාකච්ඡා කරයි
- ස්ත්‍රීන්ගේ හා සමාජයේ වටිනාකම් හා අවශ්‍යතා 'ස්ත්‍රී පුරුෂ සමාජභාවී මධ්‍යස්ථතාවයකින්' සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී භාෂාවකින් නිරූපණය කරයි
- වෙනත් ඕනෑම ව්‍යවස්ථාමය සැලසුමක් මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතාවය සහ වෙනස් කොට සැලකීම තුරන් කිරීම අරමුණු කළ යුතුය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ඉඩ සලසන සහ කාන්තාවන්ගේ ප්‍රගතියට බාධා කරන ව්‍යුහාත්මක හා වෙනත් සාධක බැහැර කළ යුතුය

මහජන නියෝජිත කොමිෂන් (PCR) සිවිල් සමාජ සංවිධාන, උනන්දුවක් දක්වන කණ්ඩායම් සහ පුද්ගලයින් වෙත ඔවුන්ගේ ගැටලු දැන ගැනීම සඳහා යොමු වූ අතර එහි දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඔවුන් විසින් දැකීමට කැමති අංග පිළිබඳව විමසීම සඳහා ජනතාව සමග සම්බන්ධ වීම සිදුවිය.

කාන්තාවන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරන සහ ඔවුන්ගේ සවිබල ගැන්වීමට දායක වන පුළුල් නිර්දේශ 4 ක් වාර්තාව අවධාරණය කරනු ලැබේ.



# 01 කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් රාජ්‍ය ආයතන ප්‍රජාතන්ත්‍රවාදී කිරීම

රාජ්‍ය ආයතන මගින් සියලු දෙනා අන්තර්ග්‍රහණය කර ගැනීම සහ කාන්තාවන්ගේ හා නියැලීම දිරිගැන්විය යුතුය.

a)




කාන්තා නියෝජිතයන් සමග ස්වාධීන සහ නියෝජිත ව්‍යවස්ථාදායකයක්

b)



ආයතනික පරීක්ෂාකිරීම් හා නිවැරදිකිරීම් මගින් නියාමනය කරනු ලබන වගකිවයුතු විධායකයක්

c)



මෙම ආයතනවල ව්‍යවස්ථා විරෝධී ක්‍රියා නිරීක්ෂණය කිරීම සඳහා ව්‍යවස්ථා අධිකරණයක්

d)



ආන්තික කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරමින් පද්ධතිමය අයුක්තිය සහ ප්‍රමාදයන් පිළිබඳව සොයා බැලීම සඳහා කාන්තා අයිතිවාසිකම් සඳහා ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී පහසුකම් සපයන්නෙකු ලෙස ස්වාධීන රාජ්‍ය සේවාවක්

e)




කාන්තාවන්ගේ ප්‍රමාණවත් නියෝජනයක් සහතික කිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල කෝටාවන්

f)



කාන්තාවන්ට එරෙහි සංස්කෘතික හා වෙනත් වෙනස්කම්වලට ඉඩ සලසන නීති හා භාවිතයන් ප්‍රතිසංස්කරණය කිරීමට ස්වාධීන කොමිෂන් සභා

## 02 පාලනය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීම

ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ඔවුන් මුහුණ දෙන අභියෝග පිළිබඳව හඬක් නැගීම සඳහා පාලනය තුළ කාන්තාවන්ගේ පෙනී සිටීම අත්‍යවශ්‍ය වේ

ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සමග නිදහස් හා සාධාරණ මැතිවරණයක් මගින් පාලනය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කරන අතරම ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීම වෙනුවෙන් සුදුසුම නියෝජිතයා තෝරා ගැනීමට ඔවුන්ට අවකාශය ලබාදෙනු ලැබේ

දේශපාලනය හා රාජ්‍ය පරිපාලනය සඳහා සමාන ප්‍රවේශයක් ලබාදීමෙන් කාන්තාවන්ට මෙන්ම පුළුල් ප්‍රජාවට බලපාන තීරණ සඳහා ඔවුන්ට සහභාගී වීමට ඉඩ සැළසේ

අක්‍රියව පවතින නිලධර පාලනයට පිළියම් යෙදීම සඳහා ජනතාවට, විශේෂයෙන් කාන්තාවන්ට පළාත් පාලන කටයුතුවලට සෘජුවම සහභාගී විය හැකි වන පරිදි ග්‍රාම සභාව/ග්‍රාම රාජ්‍යය පිහිටුවීම

## 03 කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා සමාජ ආර්ථික අයිතිවාසිකම් ව්‍යවස්ථානුකූලව තහවුරු කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සමාජ හා ආර්ථික අයිතිවාසිකම් තහවුරු කිරීම මගින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ප්‍රධාන ධාරාවට ගෙන ඒමට උපකාරී වේ.

**නීති ප්‍රතිසංස්කරණ**

- සැලකිය යුතු ලෙස සමානාත්මතාවය සඳහා ඇති අයිතිය ලබාදීම හා අධීක්ෂණය කිරීම සඳහා සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් වැළැක්වීමේ කොමිසමක්.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආමන්ත්‍රණය කිරීම.

**වැඩබිම හා ජීවනෝපායන් තුළ සමානාත්මතාවය**

- සියලුම ස්ත්‍රීන් පුරුෂයින් සඳහා වැඩ කිරීමේ අයිතිය, රැකියාව සහ ජීවනෝපාය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කළ යුතුය.
- සාධාරණ හා ආරක්ෂිත සේවා කොන්දේසි සඳහා රජය අයිතිය ලබා දිය යුතුය. උසස්වීම් සහ වෘත්තීය දියුණුව සඳහා සමාන අයිතිවාසිකම් මෙයට ඇතුළත් විය යුතුය.

**සෞඛ්‍ය, අධ්‍යාපන, පවුල් හා සමාජ අයිතීන් තුළ සමානාත්මතාවය**

- ආහාර, ජලය, නිවාස හා සමාජ සුරක්ෂිතතාවය පිළිබඳව අවශ්‍යතා ඇති පවුල් සඳහා සමාජ සුභසාධන ආධාර සැපයීමේදී කාර්යක්ෂම සුභසාධන යෝජනා ක්‍රම දක්වා ඒවා ව්‍යාප්ත විය යුතුය. මහජන අර්ථ සිද්ධි තඩුකරයන් අර්ථසිද්ධි තඩුකරයක් මාර්ගයෙන් ද ගැටලු මතු කළ හැකිය.
- ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය දිරිමත් කිරීම අවධාරණය කරමින් අධ්‍යාපනය සඳහා ඇති අයිතිය.
- සෞඛ්‍යය සඳහා ඇති අයිතියට මාතෘ, ළමා හා ප්‍රජනක සෞඛ්‍ය සේවා ඇතුළත් කාන්තාවන්ගේ සෞඛ්‍ය අයිතිය ද ඇතුළත් විය යුතුය.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන වගන්තිය මගින් ආරක්ෂා කර ඇති විවිධ පෞද්ගලික නීති, වාර්ගික-ආගමික සිරිත් විරිත් සහ කාන්තාවන්ට වෙනස් ලෙස සැලකීම් කරන පිළිවෙත් පිළිබඳව පරීක්ෂා කිරීම.
- කුටුම්භවල කොන්දේසි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් දක්වා විහිදිය යුතුය.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- ප්‍රජනන සහ ලිංගික සෞඛ්‍ය සේවාවන් කෙරෙහි අවධානය යොමු කරන සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපන ප්‍රතිපත්තිවලට සමාන්තරව දරුවන්ගේ හා තරුණයින්ගේ අයිතිවාසිකම් සංවර්ධනය කිරීම.

**පරිසරය හා තිරසරභාවය**

- පරිසරය ආරක්ෂා කිරීම සඳහා කාන්තාවන්ගේ කාර්යභාරය හඳුනා ගැනීම සහ ඔවුන්ගේ පරිසරය ආරක්ෂා කිරීම සඳහා කාන්තාවන් සවිබල ගැන්වීම.
- තිරසාර සංවර්ධනයට සහ යහපැවැත්ම සඳහා ඇති අයිතිය.

# 04 මූලික අයිතිවාසිකම් අධිකරණමය වශයෙන් බලාත්මක කිරීම

## පුරවැසියන්ගේ අයිතිවාසිකම් දාහතර

1. සිතීමේ, හෘද සාක්ෂිය හා කැමති ආගමක් ඇදහීමේ නිදහස

2. වද හිංසාවලින් තොරව ජීවත්වීමේ නිදහස

3. සමානාත්මතාවය උදෙසා ඇති අයිතිය

4. අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හා දඬුවම් කිරීමට ලක් නොවී සිටීමට ඇති නිදහස

5. භාෂණයේ නිදහස

6. සාමකාමී ලෙස එකරාශී වීමේ නිදහස

7. සංවිධානය වීමේ නිදහස

8. වෘත්තිය සමිති පිහිටුවීමට හෝ සම්බන්ධවීමට ඇති නිදහස

9. භාෂාව හා සංස්කෘතියට ඇති නිදහස

10. කැමති ව්‍යාපාරයක් හෝ වෘත්තියක නියැලීමට ඇති නිදහස

11. සංචරණය හා නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට ඇති නිදහස

12. තොරතුරු ලබා ගැනීමේ අයිතිය

13. නීතිඥ සහාය ලබා ගැනීමේ අයිතිය

14. රාජ්‍ය අධ්‍යාපනයට හා අනෙකුත් රාජ්‍ය සේවාවන් සඳහා ඇති අයිතිය

ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී, අයිතිවාසිකම් පදනම් කරගත් නීති විද්‍යාව වර්ධනය වීමට නම්, මූලික අයිතිවාසිකම්වල විෂය පථය පිළිබඳ ඔවුන්ගේ අර්ථ නිරූපණයන් පුළුල් කිරීමට අධිකරණය විවෘත විය යුතුය.

මූලික අයිතිවාසිකම් අයදුම්පත් සඳහා වන අධිකරණ බලය පුළුල් විය යුතු අතර, කාන්තාවන්ට සහ ආන්තික කණ්ඩායම්වලට යුක්තිය සඳහා පහසු ප්‍රවේශයක් ඇති කිරීම වෙනුවෙන් මහජන අර්ථසිද්ධි නඩුකරයක් සඳහා මහජන අවශ්‍යතා නඩු පැවරීම දිරිමත් කළ යුතුය.

a) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන, පනත් කෙටුම්පත් සහ පාර්ලිමේන්තුව සහ පළාත් සභා විසින් සම්මත කරන ලද නීතිවල ව්‍යවස්ථානුකූලභාවය තක්සේරු කිරීමට බලය ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයකින් නීති සමාලෝචනය කිරීම ඉතා වැදගත් ය.

b) ඔවුන්ගේ අයිතිවාසිකම් සහතික කිරීමට උත්සාහ කරන කාන්තාවන්ට සහය වීම සඳහා නිශ්චිත විධි නියෝගයක් සහිත නීති ආධාර ලබාදීම.

c) රජයේ වගවීම සහතික කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියේ නියම මූලධර්මවලින් මග පෙන්වීම: මෙම මූලධර්මයන් විසින් සකස් කරන ලද නීති සහ ප්‍රතිපත්ති මගින් හෝ අවම වශයෙන් එහි නීති සහ ප්‍රතිපත්ති හරහා මෙම මූලධර්ම උල්ලංඝනය නොකිරීම.

# සාරාංශය

කාන්තාවන්ගේ ජීවිත සහ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහාවන නීති සහ ප්‍රතිපත්ති තුළ දී කාන්තාවන්ගේ සැබෑ ජීවිත අත්දැකීම්, බාධක සහ අභියෝග අවබෝධ කර ගත යුතුය.

මහජන නියෝජන කමිටුව හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය මගින් සිදුවිය හැකි ප්‍රතිසංස්කරණ සඳහා කරුණු කිහිපයක් සහ හොඳින් සලකා බලන ලද නිර්දේශයන් පෙරමුණට ගෙන විත් තිබේ.

නව ව්‍යවස්ථාවක් පිළිබඳ කතිකාව හෝ රජය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටින සෑම අවස්ථාවකම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දෘෂ්ටිකෝණය අමතක වී තිබේ. යෝජිත හා බලාත්මක කරන ලද බොහෝ ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණවල එය නොපවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන්ගේ ජීවිත කෙරෙහි කිසිදු බලපෑමක් ඇතිවීම සිදු නොවී තිබේ.

කාන්තාවන් විසින් මෙම පසුබෑම තේරුම් ගත යුතු අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී සහ ඔවුන්ගේ අභිලාෂයන්ට සහය දෙන ව්‍යවස්ථාවක් ඉල්ලා සිටිය යුතුය.

**2020**

**අලුතින් තේරී පත් වූ රජය ද ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් ඉල්ලා සිටී – ජනාධිපතිවරයාගේ බලය පාලනය කරන වගන්ති ඉවත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් වෙනස් කිරීමට ඉල්ලා සිටී**

රට සංවර්ධනය කළ හැක්කේ අසීමිත බලතල සහිත ජනාධිපතිවරයෙකුට පමණක් බවට ඔවුහු තර්ක කරති. නව ව්‍යවස්ථාවෙන් ස්වාධීන ආයතන, පළාත් සභා සහ ද්විත්ව පුරවැසියන් පාර්ලිමේන්තුවට ඇතුළුවීම සීමා කිරීම ඉවත් කිරීමට හෝ සීමා කිරීමට ඉඩ තිබේ.

**මෙම විවාදයට කාන්තාවන් විසින් තම හඬ එක් කළ යුතුය. ඔවුන්ට පැහැදිලි අවධානයක් තිබිය යුතු අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවී දෘෂ්ටිකෝණය බැහැර කරන ව්‍යවස්ථාමය වෙනස්කම් මගින් ඔවුන්ට අදහස් කරන්නේ කුමක්ද යන්න තේරුම් ගත යුතුය.**



මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ස්වීඩන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (Sida) සහ (We Effect) අරමුදලින් මුද්‍රණය කොට ඇත˜ මෙහි එන අදහස් හා අන්තර්ගතයන්ට ˜ඉඩ හෝ We Effect ආයතන එකගවීමක් අත්‍යවශ්‍යයෙන්ම නොවන අතර එය කතෘ හා ප්‍රකාශන ආයතනයේ වගකීමක් වේ